# දේශීය නර්තන රංගවස්ත්‍රාභරණ නිර්මාණය වීමෙහිලා බලපෑ ඉන්දීය ආභාසය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

එස්. ඒ. ජී. කාවින්දයා
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය.
sakavindya@gmail.com

**සාරසංක්ෂේපය**

ලාංකේය සංස්කෘතියේ නර්තන කලාවට සුවිශේෂ ස්ථානයක් හිමි ව තිබේ. උඩරට, පහතරට සහ සබරගමු වශයෙන් මෙරට ප්‍රධාන නර්තන සම්ප්‍රදායයන් ත්‍රිකයකි. අතීතයේ දී නර්තනය තොවිල්, දේවාල නැටුම් සහ රාජ රාජ මහාමාත්‍යාදීන්ගේ ගමන් බිමන් සඳහා ද විවිධ උත්සව සඳහා මෙන් ම අභිචාර විධි උදෙසා ද යොදා ගැනිණ. මෙම නර්තනමය අවස්ථාවන්හි දී නර්තන ශිල්පීහු විවිධ රංගවස්ත්‍රාභරණයන් උපයෝගී කරගනිති. මුල් කාලීනව සාම්ප්‍රදායික නර්තනය පුරුෂ පාර්ශ්වයට පමණක් ආවේණික ව පැවතුණ ද පසුකාලීන ව කාන්තාවෝ ද නර්තන කලාවට ප්‍රවිෂ්ට වූහ. දේශීය නර්තන ඇඳුම් පැළඳුම් නිර්මාණය වීමෙහි ලා ඉන්දීය ආභාසයේ බලපෑම කෙබඳු ද යන්න අප පර්යේෂණ ප්‍රස්තුතයෙන් විමසා බැලෙයි. දේශීය සාම්ප්‍රදායික නර්තන ඇඳුම් පැළඳුම් උදෙසා විවිධ හේතුන් ඔස්සේ ඉන්දියානු ආභාසය ලැබී ඇති නමුත් නූතනය දක්වාම දේශීයත්වය ද ආරක්ෂා කර ගැනීමට හැකි වී ඇති බව උපන්‍යාස කොටගති. දේශීය නර්තන කලාවට බලපෑ ඉන්දීය ආභාසයෙහි කාලානුක්‍රමික විවිධතා මත රංගවස්ත්‍රාභරණ වෙනස්වීම පිළිබඳ අධ්‍යයනය අප පර්යේෂණ ප්‍රස්තුතයේ මුඛ්‍ය පරමාර්ථය වන අතර දේශීය නර්තන රංග වස්ත්‍රාභරණ පිළිබඳ පුරාවිද්‍යාත්මක සාධක අධ්‍යයනය කිරීම පර්යේෂණ උප අරමුණ වේ. ඓතිහාසික පර්යේෂණ ක්‍රමවේදයට අනුගතව අප පර්යේෂණය සිදුකෙරිණ. සාහිත්‍ය මූලාශ්‍ර අධ්‍යයනය සහ සම්මුඛ සාකච්ඡා ඔස්සේ දත්ත එක්රැස් කෙරුණු අතර තාර්කික විශ්ලේෂණයට අනුගතව නිගමන කරා එළැඹිණ. ඒ අනුව ලාංකේය විවිධ රාජධානි සමයන්හි දෙරට අතර සිදු වූ රාජකීය විවාහයන් සහ නායක්කර් වංශික රාජකීය බලපෑම් මෙන් ම ලාංකේය සිනමාවේ ආරම්භක යුගයේ දී ඉන්දීය ලක්ෂණ අන්තර්ගත වීමත් ලාංකේය නර්තන රංග වස්ත්‍රාභරණයන්ට ඉන්දීය ආභාසය ලැබීමට හේතු වූ බව විද්‍යමාන විය. තවද ලාංකේය දේවාල නර්තනයන්හි මූලාරම්භයේ සිට ම ඉන්දීය ලක්ෂණ අන්තර්ගත ව පැවතීමත්, පසුකාලීන ව මෙරට නර්තන ශිල්පීන් අධ්‍යාපනය ලැබීම සඳහා ඉන්දියාවට යාමේ ප්‍රවණතාවයත් හේතුවෙන් ඉන්දීය ආභාසය දේශීය නර්තන රංගයට මෙන් ම වස්ත්‍රාභරණයන්ට ද සුසංයෝග වූ බව විශද විය.

**ප්‍රමුඛ පද:** ඉන්දීය ආභාසය, දේවාල නර්තනය, නර්තන රංගවස්ත්‍රාභරණ, නර්තන රූකම්, සාම්ප්‍රදායික නර්තනය

# An Investigative Study of Indian Influences in the Creation of Native Dance Costumes

S.A.G. Kavindya

University of the Visual & Performing Arts

sakavindya@gmail.com

## Abstract

Dancing has a significant importance in the Sri Lankan culture. There are three main dance traditions in our country. They are known as Up Country Dance, Low Country Dance and Sabaragamuwa Dance. In the past, dance was used for different purposes. Since ancient times, dance has been used for various royal functions, festivals and rituals. The costume is the best way of expressing the idea of the dance. In the past, traditional dance was restricted only to men, but nowadays, women are also involved in the dance. Accordingly, the problem of this research is how Indian influence aspires to the creation of local dance costumes. Traditional dance costumes have been inspired by India for various reasons. However, our traditional traits were also assumed to be preserved. The primary objective of our research is to study the changes in the Indian influence that influenced the local dance art and native dance costumes at different times. The other research objective is to study the archaeological influence of local dance costumes on local dance traditions. Data was collected through the study of primary and secondary sources and interviews. This research follows historical research methodology. Conclusions were drawn following the logical analysis method. Consistently, the royal marriages between the two countries during different kingdoms and the influence of the Nayakkar dynasty led to the Indian influence on Sri Lankan dancing clothing. Also, it was concluded that the presence of Indian characteristics in temple dances and the dancers going to India for education also influenced it.

**Keywords -** Dance costumes, Dancing statues, Devala dance, Indian inspiration, Traditional dance